**කටුනායක සීදූව නගර සභාව - 2021**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කටුනායක සීදූව නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කටුනායක සීදූව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු මෝටර් රථයක් රු.1,300,000 කට තක්සේරු කර ගිණුම්ගත කිරීමේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් අංක 05 යටතේ ක්ෂය වටිනාකම හඳුනා නොගෙන මුළු මුදලම සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඊළඟ වර්ෂයේ අවසන් ගිණුම මගින් මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ප්‍රමිත අංක 11.10 හා 2021 පෙබරවාරි 12 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ LGD/10A/4/න.ගි./2019 අංක දරන චක්‍රලේඛයේ 6 වගන්තිය ප්‍රකාරව ආයතනය මඟින් හා ආයතනයට එරෙහිව ඉදිරිපත් කර ඇති නඩු සම්බන්ධ තොරතුරු සටහනක් ලෙස ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඇ) | ප්‍රමිත අංක 18.5(ඇ) හා 2021 පෙබරවාරි 22 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ LGD/10A/4/න.ගි./2019 අංක දරන චක්‍රලේඛයේ 2 වගන්තිය ප්‍රකාරව ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ සංචිත හා වෙන් කිරීම් සඳහන් කිරීමට වෙනම තීරුවක් යොදා ගෙන නොතිබුණි. | ඊළඟ වර්ෂයේ අවසන් ගිණුම මගින් මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් වූ නමුත් භෞතිකව සොයාගත නොහැකි වූ පර්චස් 21ක කටුනායක අඹගහවත්ත නැමති ඉඩම රු.4,200,000 කට තක්සේරු කර ගිණුම්ගත කර තිබූ අතර එම ඉඩම භෞතිකව හඳුනා නොගැනීම පිළිබඳ ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | 2019 වර්ෂයේදී රු.2,000,000 කට කොන්ක්‍රීට් කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණු රුදිගුවත්ත ප්‍රධාන මාර්ගය 2021 වර්ෂයේදී කොන්ක්‍රීට් කිරීම වෙනුවට තාර දමා සංවර්ධනය කර තිබුණ අතර එහි වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබියදී කොන්ක්‍රීට් කිරීම සඳහා 2019 වර්ෂයේදී ඇස්තමේන්තු කර තිබුණු රු.2,000,000 සමාලෝචිත වර්ෂය අවසානයට නොනිම් වැඩ ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරි වර්ෂයේදී සිදු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | තෙල් කෝච්චි පාර ප්‍රජාශාලාව රු.40,000,000 කට තක්සේරු කර ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබියදී එය නොනිම් වැඩ යටතේද රු.1,662,461 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් නොනිම් වැඩ ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබී තිබුණු රු.864,000 ක පෙර මුදල් (key money), ඉකුත් වර්ෂයට අදාළව ලැබී ඇති සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී, 2019 වර්ෂයේ තැන්පතුවකින් හිලව් කර තිබුණු 2020 වර්ෂයට අදාල රු.425,333 ක පොල ගාස්තු ආදායම් ණයගැතියන්ට බැර නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරි වර්ෂයේදී සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සේවක ඇප තැන්පත් නිදහස් කිරීම සඳහා බැංකුවෙන් ලැබී තිබුණු රු.22,523 ක් වටිනාකම වූ චෙක්පතක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ ශේෂයට ගලපා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වරිපනම් බදු විෂයයේ 2021 දෙසැම්බර් 31 දිනට ගිණුමේ ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂය අතර රු.6,558,827 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | පවතින ශේෂ වෙනස්කම නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) අංක 103 (1) (ආ) සහ අංක 104 | 2021 ජූලි 05 දින අනතුරට පත් ත්‍රී රෝද රථය සම්බන්ධයෙන් අදාළ මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණු අතර රථය අළුත්වැඩියා කිරීම සඳහා රක්ෂණය මගින් ප්‍රතිපූර්ණය නොකළ රු.10,405 ක මුදල සභා අරමුදලින් දරා තිබුණි. | රජයේ මුදල් රෙගුලාසි 103(1)(ආ) ප්‍රකාරව හදිසි අනතුර සම්බන්ධයෙන් පොලිසියට වාර්තා නොකිරීම වරදක් බව පිළිගන්නා අතර මුදල් රෙගුලාසි 104(1) පරිදි පරීක්ෂණයක් සිදු කර අලාභය සිදු කළ, රියදුරුගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) අංක 396(ඈ) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොකරන ලද වටිනාකම රු.926,976 ක් වූ රාජ්‍ය බැංකුවක චෙක්පත් 36 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | සියළුම චෙක්පත් ආදායමට ගැනීමට කටයුතු කරමින් සිටින බව දන්වමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.193,042,302 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.199,670,282 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජනවාරි 01 දිනට වූ වරිපනම් බදු හිඟය, සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.9,096,000 කින් වැඩිවී තිබු අතර වර්ෂය අවසානයට දක්වා තිබු හිගය තුළ වාණිජ ආයතන 80 ක රු.50,000 වැඩි හිඟව පැවති මුදල රු.12,651,743 ක් විය. | මේ වන විට තවදුරටත් අය කළ යුතු හිඟ අය කර ගැනීමට අදාළ කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තු ඇස්තමේන්තුගත ආදායම රු.5,001,000 ක් වුවද බිල් කිරීම් හා රැස්කිරීම් රු.3,163,000 ක් වී තිබූ අතර ව්‍යාපාර සමීක්ෂණයෙන් ව්‍යාපාර 563 ක් හදුනාගෙන තිබුණද බලපත්‍ර ලබාගෙන තිබුණේ ව්‍යාපාර 313 ක් පමණක් වූ හෙයින් නොගෙවූ ආයතන සම්බන්ධයෙන් නීති මඟින් කටයුතු කර නොතිබුණි. | රට තුල පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් මේ සම්බන්ධයෙන් නීතිමය පියවර නොගත් බව දන්වා සිටිමි. | බලපත්‍ර ලබානොගත් ව්‍යාපාර සම්බන්ධයෙන් නීති මගින් කටයුතු කළ යුතුවේ. |

**2.2.2 කුලී**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීදූව නව වෙළඳ සංකීර්ණයේ පැරණි වෙළඳ සැල් හිමියන්ට ලබා දී තිබුණු කඩ කාමර 12 ක් සඳහා සභා අනුමැතිය අනුව 2010 මැයි 31 සිට 2012 මැයි 31 දින | 2019 සැප්තැම්බර් 27 සභා අනුමැතිය මත කුලී මුදල් සියයට 50 ක් අය කිරීමට අනුමැතිය ලැබී ඇත. | රජයේ තක්සේරුව අනුව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | දක්වා වූ වසර 2 ක් සඳහා පමණක් තක්සේරු මුදලින් සියයට 50 ක මුදලක් අය කළ යුතු වුවත් 2010 වර්ෂයේ සිට 2018 අගෝස්තු දක්වා වසර 8 1/2 කට වැඩි කාලයක් සියයට 50 බැගින් අයකර තිබුණි. 2017 ජුනි මාසයේ නැවත ලබා දී තිබු තක්සේරුව ක්‍රියාත්මක නොකොට සභා තීරණයක් මත 2018 සැප්තැම්බර් 01 දින සිට අය කෙරෙන කුලිය සංශෝධනය කර 2021 දෙසැම්බර් දක්වාම අයකර තිබු අතර පළාත් පාලන කොමසාරිස්ගේ 2016 නොවැම්බර් 01 දිනැති අංක LGD/13/2016 දරන චක්‍රලේඛයට අනුව සෑම වසර තුනකට වරක් මාසික කුලිය රජයේ තක්සේරුවක් මත ප්‍රතිශෝධනය වියයුතු වු වද ඒ අනුව බදු කුලිය සංශෝධනය කර නොතිබුණි. | | |
| (ආ) | කටුනායක වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා 2019 ජුලි 30 දින තක්සේරු වාර්තාවක් ලැබී තිබුණද එය ක්‍රියාත්මක නොකොට කඩ කාමර 06 ක් සඳහා වසර 07 කට වඩා පැරණි 2013 වර්ෂයේ තක්සේරු මුදලක්ද, කඩ කාමර 04 ක් සඳහා සභා අනුමැතියක් මත 2013 වර්ෂයේ තක්සේරු මුදලින් සියයට 50 ක මුදලක්ද 2021 දෙසැම්බර් දක්වාම අයකර තිබුණි. | 2014 අගෝස්තු 29 දින නව තක්සේරු කුලී මුදල වැඩි වී ඇති බැවින් එහි සාධාරණයක් කර දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එකී ඉල්ලීම 2019 සැප්තැම්බර් 27 දින පැවති මහා සභාවට යොමු කිරීමෙන් අනතුරුව පැරණි මුදලට අයකිරීමට තීරණය කරන ලදී. | රජයේ තක්සේරුව අනුව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ලංකා සතොස ආයතනය වෙත සීදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 06 ක් සහ කටුනායක වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක් බදු දී තිබු අතර එම කඩ කාමරවල බදු ගිවිසුම්වල වලංගු කාලය පිළිවෙලින් 2015 මාර්තු 17 හා 2015 දෙසැම්බර් 04 ඉක්මවා ගොස් තිබුණි. බදු ගිවිසුම් අවලංගු වී වසර 06 ක් පමණ ගතවී තිබුණද දෙපාර්ශවය විසින් වලංගු ගිවිසුම්වලට එළඹීමට ක්‍රියා කොට නොතිබුණි. | නව තක්සේරු මුදල 2022 ජනවාරි මස සිට ක්‍රියාත්මක කර ඇති අතර සීදූව වෙළඳ සංකීර්ණය සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීම සම්බන්ධයෙන් 2022 පෙබරවාරි 24 දිනැතිව සිහි කැඳවීම් ලිපියක් යොමුකර ඇත. | නීත්‍යානුකූල ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | කටුනායක පොදු වෙළඳපල අසල කඩ කාමර අංක 01 හා 02 කඩ කාමර ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවක් රහිතව 2021 ජූලි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා පිළිවෙලින් රු.7,500 හා රු.7,700 කුලී මුදලකට බදු දී තිබුණු අතර 2022 වසර සඳහාද තක්සේරුවකින් තොරව | 2021 පෙබරවාරි 25 දින පැවති මහා සභාවේ තීරණය අනුව තාවකාලික තක්සේරුවක් සිදු කර එම තක්සේරුව අය කර ඇති අතර 2022 වර්ෂය සඳහාද එම වටිනාකම අනුව කඩ කුලී අයකර ඇති බව දන්වමි. | ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවක් මත කුලී අය කළ යුතු වේ |

| | | | |
|---|---|---|---|
| | අවම ලංසුව පිළිවෙලින් රු.7,500 හා රු.7,700 ලෙස තීරණය කරමින් 2021 ඔක්තෝබර් 07 දින ප්‍රසම්පාදන දැන්වීමක් පලකර තිබුණි. | | |
| (ඉ) | ඇවරිවත්ත දිනපතා පොළ බදු දීම සම්බන්ධයෙන් 2021 නොවැම්බර් 15 දින විගණනය විසින් සිදුකරණ ලද ස්ථානීය පරීක්ෂාවේදී කුලී අයකළ යුතු කඩ කාමරවලට අමතරව පදික වේදිකාවේ ඉදිකර තිබුණු අනවසර කඩ 37 කින් බදුකරු විසින් කුලී මුදල් අයකරමින් තිබුණි. | අනවසර කඩකාමර වලින් බදු අය නොකළ යුතු බව තවදුරටත් දැනුවත් කර ඇති අතර කඩ කාමර ඉවත් කිරීමට නියමිතව තිබුණද රටේ දැනට පවතින අයහපත් ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගෙන අනවසර කඩකාමර ඉවත් කිරීම තාවකාලිකව අත්හිටුවීමට තීරණය කරන ලද බව දන්වමි. | අනවසර කඩකාමර වලින් කුලී අය නොකළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

නගර සභා ආඥාපනතේ 4වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීදුව ලියනගේමුල්ල පල්ලිය පාරේ සිට කරුණාරත්න මාවත දක්වා දුම්රිය රක්ෂිතය ප්‍රවේශ මාර්ගය ලෙස භාවිතා කළ පදිංචිකරුවන්ට මාර්ග අවහිරතාවය ඉවත් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී පෞද්ගලික ඉඩම්වලින් අඩි 10 ක බිම් තීරුවක් සභාවට පවරා ගෙන මෙම ඉඩම් කොටස්කරුවන්ට කරුණාරත්න මාවත භාවිතා කිරීමට ඉඩ සලස්වා ඉඩම් කට්ටි අංක 11 තක්සේරුව වූ රු.882,500 ක මුදල වන්දිය ලෙස ගෙවීම සිදු නොකොට, දුම්රිය පල පාර භාවිතා කිරීමට ඉඩ සලස්වා ඉඩම් කොටස් අංක 01 තක්සේරුව වූ රු.1,887,000 ක වන්දි මුදල ප්‍රාදේශීය ලේකම් කටාන වෙත 2017 පෙබරවාරි 23 දින තැන්පත් කර තිබුණි. මෙම ඉඩම් අත්පත් | නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ඉඩම් අත්පත් කර ගැනිමේ කාර්යය සිදු කරන ලද අතර වන්දි මුදල් ප්‍රමාදයකින් තොරව නියමිත වේලාවට ගෙවීමට කටයුතු කරන බව ප්‍රකාශ කරමි. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආයතන ගණනාවක් සම්බන්ධ කරගෙන සිදුකරනු ලබන දීර්ඝ ක්‍රියාවලියකි. තවද, පසුගිය කොවිඩ් වසංගතය හමුවේ යම් | වන්දි ගෙවිම සභාවට වාසිදායක අන්දමින් සිදුකළ යුතු අතර එය ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර ගැනීමේ පනත යටතේ වන්දියට අමතරව ඉඩමේ හදිසි භුක්තිය භාරගන්නා දිනයේ සිට වන්දි ගෙවීම අවසන් දිනය දක්වා සියයට 7 ක පොලී මුදලක් ගෙවීමට සිදුවන අතර එවිට ඉඩම් කට්ටි අංක 01 පවරා ගැනීමේදී විශාල පොලී මුදලක්ද ගෙවිමට සිදු වනු ඇත. යම් තක්සේරුවක් වර්ෂ 3 ක කාලයක් බල පැවැත්වෙන අතර මේ වන විට වර්ෂ 5 ක කාලයක් ගත වී ඇති අතර ගෙවීමට සිදුවන වන්දි මුදල හා පොලිය මීට වඩා වැඩි වන බවද නිරීක්ෂණය විය. | ප්‍රමාදයක් සිදුවූ අතර අදාල සියළු ලිපි ලේඛන පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති බව වාර්තා කරමි. | |
| (ආ) | 2021 අයවැය ලේඛනයේ සඳහන් සේවක ණය උපරිම හර ශේෂ සීමාව රු.5,000,000 ක් වුවද සමාලෝචිත වර්ෂයේ අවසානයේ මුල්‍ය ප්‍රකාශන අනුව එය රු.29,457,290 ක් වූයෙන් උපරිම හර ශේෂ සීමාව රු.24,457,290 කින් ඉක්මවා තිබුණි. | ඊළඟ වර්ෂයේ සිට ප්‍රමාණවත් පරිදි උපරිම හා අවම සීමාවන් නිවැරදි ලෙස පනවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | සේවක ණය සම්බන්ධයෙන් උපරිම හා අවම සීමාවන් පනවා ගත යුතු වේ. |

**3.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් දකුණු සීදූව ප්‍රජා ශාලාවේ කොටසක් 1997 වර්ෂයේ සිට කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා නීත්‍යානුකූල ලියවිල්ලකින් තොරව පුද්ගලයෙක් වෙත නොමිලයේ ලබා දී තිබුණු බව 2021 නොවැම්බර් 12 දින සිදු කළ ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය. | මේ පිළිබඳව සොයා බලා තවදුරටත් විධිමත් කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව දන්වමි. | සභාවේ දේපල විධිමත් හා නීත්‍යානුකූල අයුරින් මහජන සුභසාධනය සඳහා යෙදවිය යුතු වේ. |